සැ. යු. - 2024.03.15 දින පළකරන ලද අංක 2376 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,377 - 2024 මාර්තු මස 22 වැනි සිකුරාදා - 2024.03.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 68 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 69 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 71 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 අප්‍රේල් 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## බලංගොඩ දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

*කොළඹ දිසා අධිකරණ*
*නඩු අංකය :* DMR 1937/17
*බලංගොඩ දිසා අධිකරණ*
*ඇස්කිසි අංකය :*

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,

අංක 236, ගාලු පාර, කොළඹ 03.

......................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. උඩවත්තගේ රංජිත් උඩවත්ත,
අංක 46/4, කොටුගොඩැල්ල, බලංගොඩ.

02. නක්කාවිට කංකානමලාගේ යසන්ත සංජීව ආරියපාල,
අංක 123, තුඹගොඩ, බලංගොඩ.

03. බස්නායක මුදියන්සේලාගේ උදය ලාලන විමල් බණ්ඩාර,
මැද්දේකන්ද, බලංගොඩ.

......................*විත්තිකරුවන්.*

ඉහත නම් 1 වන සඳහන් විත්තිකරු වෙත ය.

වර්ෂ 2020 ක් වූ මැයි මස 29 වැනි දින ඇතුලත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට,

*(අ)* වර්ෂ 2017ක් වූ මාර්තු මස 13 වැනි දිනට අයවිය යුතු රු. 1,634,916.74 ක මුදලක් සහ 2017.03.14 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු මසකට 5%ක දඩ පොලියක් ගෙවීමටත්,

*(ආ)* නඩු ගාස්තු, සහ

*(ඇ)* ගරු අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ අනිකුත් සහනයන් ද ලබා දීමටත්,

තව ද, පොලිය අයකර ගැනීමේ දී සිවිල් ආඥපනතේ 05 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව විය යුතු බවටත් ය.

ඒ අනුව විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශයෙන් පසුව කිසිදු මුදලක් ගෙවා නොමැති බවත්, මුදල් ගෙවීමට අපොහොසත් වී සහ පැහැර හැර ඇති බවත්, ඒ අනුව විත්තිකරුට අයත් චංචල සහ නිශ්චල දේපළ වත්කම් බැරකම් සහ ලැබීම් තහනම් කර අවශ්‍ය වුවහොත් ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා මුදල් අයකර දීමට බලය පැවරී ඇති හෙයින් ද, මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ,

**වර්ෂ 2024 මැයි මස 06 වැනි දින ප. ව. 1.00 ට,**

එකී දේපළ පිහිටා ඇති බලංගොඩ, හතරබාගේ, පිල්ලකුඹුර, ඇහැලතැන්නේ හේන නමැති පාසල පිටුපස පිහිටි දේපළ, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුල් ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
3. වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාළ මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරලේ, උඩුවග්ගම් පත්තුවේ, බලංගොඩ හතර බාගේ, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත්, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලසීමාව තුළ හතරබාගේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, පීල්ලකුඹුර ගමේ පිහිටි ''ඇහැලතැන්නේහේන'' යන ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ටී. පී. පෙරේරා සෑදූ අංක 3180 හා 2008/11/04 දින දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක 1,3,5,6,7 සහ 8 දරන ඒකාබද්ධ ඉඩමට මායිම් : උතුරට : පාසැල්වත්ත සහ ටී. ආර්. ධර්මරත්නගේ ඉඩම ද හා කැබලි අංක 2 සහ 4, නැගෙනහිරට : කුඹුර ඉඩම ද, දකුණට : කුඹුරු ඉඩම සහ එම්. එල්. වික්‍රමසිංහගේ ඉඩම ද සහ බස්නාහිරට : එම්. එල්. වික්‍රමසිංහ අයිතිවාසිකම් කියන ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විසිහතරයි දශම හය (අක්. 01, රූඩ්. 01, පර්. 24.6) ක් විශාල ඉඩම ද, එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේ ද, එම ඉඩමට ඇති පිවිසුම් මාර්ගවල යාම්, ඊම් වාහන ගමනාගමනයට ජලනළ එලා ගැනීමට, විදුලි කාණු සිටුවා ගැනීමට ඇති සියලුම මාර්ග පරවශතා අයිතිවාසිකම් ද සමග සියලු දේ ද වේ. මෙම ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 239/216 හි ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.-*

ඕලුගංතොට හන්දියේ සිට හතරබාග ප්‍රදේශයට පැමිණෙන මාර්ගයේ කි. මී. 4.5 ක් පමණ ගිය පසු හතරබාගේ පාසල දකුණු පසින් හමුවේ. එම පාසල් මායිමෙන් දකුණට හමුවන පාරේ කෙළවර හමුවන විශාල ඉඩම.

ඒ. ඩී. සුරවීර,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය- බලංගොඩ.

වර්ෂ 2024ක් වූ පෙබරවාරි මස 26 වැනි දින.

03-392

---

# නොතාරිස් ලැයිස්තුව

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

මහනුවර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ ආර්. එස්. කේ. චන්ද්‍රකාන්ති මහත්මියගේ 2023.03.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

එම්. එල්. ගම්මම්පිල,
අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන),
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ.

03-381

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

පානදුර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ දොන් කුලසිරි විජේසූරිය මහතාගේ 2023.05.15 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ.

03-382

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

ගම්පහ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ කරුණානායක මුදියන්සේලාගේ හරිස්චන්ද්‍ර කරුණානායක මහතා විසින් නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීම 2023.01.22 දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ.

03-383

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

රත්නපුර මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ පරාක්‍රම ජයේන්ද්‍රනාථ් ශුභවික්‍රම මහතාගේ 2023.06.17 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමතකර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ.

03-384

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කැගල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ දිසානායක අප්පුහාමිලාගේ සිරිසේන මහතාගේ 2023.04.01 දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමතකර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

03-385

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ ගර්වින් බැස්ටියන්ස් හතමුනේ ලියනගේ මහතාගේ 2022.03.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමතකර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

03-386

---

# විවිධ දැන්වීම්

### පාර්ලිමේන්තුව

කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ ''කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වන්නේ පහත සඳහන් පොදු අරමුණු ඇති එකී ආයතනය (සංගමය) සංස්ථාගත කිරීමයි.-

1. අපේක්ෂකයින්ගේ අවශ්‍යතා පිළිබිඹු කරමින් ඉංග්‍රීසි සහ රංග කලාවෙන් වාචික හා ලිඛිත සන්නිවේදනයේ පුළුල් පරාසයක විෂයමාලා සකස් කිරීම සහ විභාග පැවැත්වීම ;

2. ඉංග්‍රීසි, කථනය, නාට්‍ය සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ ගුරුවරුන් අතර මිත්‍රත්වයේ සහ අවබෝධයේ සමීප බැඳීමක් ඇති කිරීම සහ දිරිගැන්වීම ;

3. නිතිපතා ගුරු පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ පුද්ගලික සහ වෘත්තීය සන්නිවේදන කුසලතා වර්ධනය සඳහා පාඨමාලා පැවැත්වීම,

යනාදිය වේ.

ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම්,
මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී.

03-354

---

## පාර්ලිමේන්තුව

නිපුණතා සංවර්ධන සහ පුහුණු කිරීමේ ජාත්‍යන්තර ආයතනය (එස්. ඩී . ටී. අයි. කැම්පස්) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

ජේ. සී. අලවතුවල වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ ''නිපුණතා සංවර්ධන සහ පුහුණු කිරීමේ ජාත්‍යන්තර ආයතනය (එස්. ඩී. ටී. අයි. කැම්පස්) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ආයතනය සංස්ථාගත කිරීමයි:-

(අ) විදේශ විශ්වවිද්‍යාල මඟින් පවත්වාගෙන යනු ලබන උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා දේශීය හා විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශ්‍රී ලංකාව තුළ දී හැදෑරීමට කටයුතු කිරීම.

(ආ) දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලට සරිලන ලෙස, විධිමත් ක්‍රියාපටිපාටියක් යටතේ වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම.

(ඇ) ශ්‍රී ලංකාව තුළ අපනයන නිෂ්පාදන සහ ආනයන නිෂ්පාදන ආදේශක වෙනුවෙන් තරුණ තරුණියන් ව්‍යවසායකයන් ලෙස බල ගැන්වීම සඳහා ව්‍යවසායක පුහුණු පාඨමාලා පැවැත්වීම,

යනාදිය වේ.

ජේ. සී. අලවතුවල,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

03-350

---

කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

**ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීමයි**

(එහි සිවිල්/වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ය)

කොළඹ 07, ධර්මපාල මාවත, අංක 245 දරන ස්ථානයේ පිහිටි ටීකේඑස්. ෆයිනෑන්ස් ලිමිටඩ් (පී. බී. 3793) පිළිබඳ කාරණාවේ දී ය.

නඩු අංකය : CHC/82/2019 CO
වටිනාකම : රු. 1,000,000
කාර්යපටිපාටිය : ලඝු

ටීකේඑස්. ෆයිනෑන්ස් ලිමිටඩ්,
අංක 245, ධර්මපාල මාවත, කොළඹ 07.

*.....................පෙත්සම්කරු.*

කොළඹ 07, ධර්මපාල මාවත, අංක 245 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ටීකේඑස්. ෆයිනෑන්ස් ලිමිටඩ් (පී. බී. 3793) ගණන් බේරා වසා දැමීම සඳහා **2019 ක් වූ නොවැම්බර් මස 08** වැනි දින දරන පෙත්සම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම **2024 ක් වූ**

**මැයි මස 30 වැනි** දිනට නියමකර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එම විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණය හිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත් හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ඉන්දුල හේවගේ,
අංක 120, සන්තානම්පිටිය පාර, ගංගොඩවිල, නුගේගොඩ.

***සටහන*** **:** මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තුවන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් නීතිඥ ඉන්දුල හේවගේ වෙත ලිඛිතව දන්වා භාරදිය යුතු ය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර **2024.05.29 වැනි දින පස්වරු 6.00** ට පෙර බාරදිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගෙන් ලිපිනයට උක්ත දිනයට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

03-359

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.